








## ස්වයං රැකියාවට නව මඟක්...

# මල් සැකසුම් කලාව

මල් යනු සොබාදහමේ තවත් අපූර්වතම නිර්මාණයකි. මලෙක සුවඳ, පැහැය හා සුන්දරත්වය රස විඳීමේ සොඳුරු සීමාවන් ඇත්තේ ඔබ සතුවමය. සැබැවින්ම මල් යනු ආදරය, සතුට, චමත්කාරය මෙන්ම ශෝකය ද ප්‍රකාශ කළ හැකි සිතුවිලි වලින් බර නිහඬ මාධ්‍යයකි. ඈත අතීතයේ සිටම මල් ශ්‍රී ලාංකිකයින්ගේ ආගමානුකූල ජීවන රටාවට බෙහෙවින්ම සමීපය. අපේ අතීත වංශ කථාවේ එන විවිධ සිදුවීම් රැගත් සිතුවම්, පෞරාණික කලා කෘතීන්, කාන්තාව හා මල් අතර සමීපත්වය විදහාපායි.

වර්තමානයේ වන විට මල් සැකසුම්



කලාවක් බවට පත්වී ප්‍රමුඛ පෙළේ ධනෝපායන මාර්ගයක් බවට පත්ව ඇත. මල් සැකසුම් කලාව යනු විවිධ වූ මල්, විසිතුරු පත්‍රික ශාක, නොයෙකුත් අලංකාර හැඩතල සහිත ද්‍රව්‍ය භාවිතා කරමින් කරනු ලබන අපූර්ව නිර්මාණයක්. අද දවසේ නව පරපුර මේ සඳහා දක්වන නැඹුරුතාවය ඉහළය. මල් සුබෝපබෝගී භාණ්ඩයක් ලෙස සකසන බටහිර යුරෝපා රටවලින් මෙරටට එකතු වන තාක්ෂණය හා සංස්කෘතිමය වෙනස් වීම් නිසා මල් සැකසුම් කලාවේ නිරත ආයතන හා සේවා දායකින් ද දිනෙන් දින ඉහළ සේවයක් සපයමින් ජනප්‍රිය වෙමින් පවතී.

## මල් සැකසුම් පිළියෙල කිරීම

මල් සැකසුමක් සකසන විට එය වඩාත් සාර්ථක නිර්මාණයක් බවට පත් කර ගැනීමට ඔබට පහත දෑ අවශ්‍ය වේ.

- මල් (ප්‍රධාන මල්, පිරවුම් මල් සහ විසිතුරු පත්‍ර)
- විසිතුරු බඳුන්
- මල් රඳවන කැට (Wet Forms)
- කම්බි සහ කතුරු
- සෙකටියර්
- මල් කල් තබා ගැනීමට අවශ්‍ය දෑ

## ප්‍රධාන මල්

ප්‍රධාන මල් වශයෙන් වර්තමානයේ ඉහළ ඉල්ලුමක් ඇත්තේ රෝස, ජර්බෙරා, කානේෂන්, ඇන්තූරියම් (Lady jane) සහ ඕකිඩ් වැනි මල් වලටය. මීට අමතරව ඇල්ස්ට්‍රෝමේරියා, ලිලී (සැන්තඩිෂියා), කපුරු, හයිඩ්‍රජන්ජියා සහ දේශීයව නෙළුම් මල් භාවිතා කරයි.

## පිරවුම් මල්

පිරවුම් මල් උපයෝගී කර ගන්නේ ප්‍රධාන මල් අතර හිස් අවකාශය පිරවීමටය. මේ සඳහා බේබිස් බ්‍රෙත්, ස්ටැටිස් (මාස 2,3 ක් පමණ කල් තබා ගත හැක). ඔක් අයි ඩේසි වැනි මල් භාවිතා කරයි. බේබිස් බ්‍රෙත් මල් මිල අධික නිසා සුපර් ඩේසි ශ්‍රී ලංකාවේ ජනප්‍රිය පිරවුම් මලක් ලෙස භාවිතා කරයි. මීට අමතරව වී කරල් විවිධ වර්ණයන්ගෙන් (gold/ silver) හැඩගන්වා භාවිතා කරයි.

## විසිතුරු පත්‍ර

මේ සඳහා පහත සඳහන් විසිතුරු පත්‍ර ශ්‍රී ලංකාවේ ජනප්‍රියය. ජලය සහ ග්ලිසරින් මිශ්‍රිත ද්‍රාවණයක් ආලේප කිරීමෙන් දිලිසෙන සුළු පෙනුමක් ලබා ගත හැක.

- මඩු කොළ
- ලෙදර් ෆර්න්
- හෙලිකෝනියා කොළ
- ඇස්පැරගස්
- කෝඩ් ලයින් (විශාල අපනනයන විභවයක් පවතී)

## විසිතුරු බඳුන්

විවිධාකාර විසිතුරු බඳුන් වෙළඳපොළෙහි දක්නට ඇත. මැටි, ප්ලාස්ටික් සහ මැටි බඳුන් මේ අතරින් ජනප්‍රිය වේ. මෙම බඳුන් සායම් ආලේප කිරීමෙන් විසිතුරු ගල් ඇල්ලීමෙන් සහ වර්ණ ගන්වන ලද ලණු එතීමෙන් වඩාත් අලංකාර කර ගත හැක.

## විවිධ කම්බි වර්ග

මේ සඳහා විවිධ වර්ණයන්ගෙන් යුත් කම්බි වර්ග භාවිතා කරනු ලැබේ. (නෙළුම් මල් - ගේජ් 18, ජර්බෙරා - ගේජ් 20)

## මල් රඳවන කැට/ ආධාරක

ස්වභාවික මල් සඳහා ජලය උරා ගනු ලබන වෙට් ෆෝර්ම් ද කෘතිම මල් සඳහා ඩ්‍රයි ෆෝර්ම් ද භාවිතා කරනු ලැබේ. මීට අමතරව ෆ්ලෝරල් ෆෝර්ම්ස් (සති 2 සිට මාස තුනක් පමණ ජලය යොදා කල් තබා ගත හැක.) ජපානයේ ඉකෙබානා මල් සැකසුම් සඳහා නේල් බෝර්ඩ් වර්ගයේ ආධාරක බහුලව භාවිතා කෙරේ.

## සෙකටියර්

මල් සහ විසිතුරු පත්‍ර අවශ්‍ය දිග ප්‍රමාණයට සහ හැඩතල අනුව කැපීම සඳහා විවිධ වර්ගයේ සෙකටියර් භාවිතා කරයි.













### මල් කල් තබා ගැනීමට සුදුසු දියර

- සීනි හෝ ග්ලූකෝස් දියර (ග්‍රෑම් 5 ක් වතුර ලීටර් 1 ක දියකර ගන්න)
- ස්ප්‍රයිට් (Sprite) හෝ සවන් අප් (7 Up) 50% දියරය
- විටමින් සී පෙති 3 - 4 ක් වතුර ලීටර් 1 ක දියකර

### මල් සඳහා කළ යුතු සත්කාර

- නටුවේ කෙළවර තරමක් උණුසුම් වතුර තුළ දී කපන්න
- මල් අව්වුවේ නොතබන්න
- මල් නටුවේ ඇති පත්‍ර වතුර තුළ නොගිල්ලවන්න
- මල් නටුව කැපීම සඳහා තියුණු ආයුධයක් භාවිතා කරන්න
- මල් නටුවේ කෙළවර ඇලයට (ආනතව) කපන්න
- කහ පැහැ ගැන්වී ඇති මල් පෙති හා පත්‍ර ගලවා දමන්න
- මල් දැමීම සඳහා ප්ලාස්ටික් බඳුන් පමණක් භාවිතා කරන්න
- ටැප් වතුර ඒ ලෙසම භාවිතා කිරීමෙන් මල් වලට හානි සිදුවිය හැක

### මල් සැකසුම් මූලධර්ම

- වර්ණ සංයෝජනය - වර්ණ චක්‍රයේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ වර්ණ වඩාත් ගැලපේ.
- සමබරතාවය - යොදාගනු ලබන මල්, කොළ නිර්මාණය තුළ සමබර වීම.
- විවිධ හැඩතල - සිග් සැග්, චක්‍රාකාර, ඕවලාකාර, වශයෙන් හැඩ රාශියකි.
- පරිමාණය හා ප්‍රමාණකූලතාව - නිර්මාණය සඳහා යොදා ගනු ලබන ද්‍රව්‍ය ප්‍රමාණවත්ව හා ගැලපෙන සේ යෙදීම.

### මල් සැරසිල්ලක් ලස්සන වන්නට නම්,

මල් සැරසිල්ල සඳහා යොදා ගනු ලබන මල් වර්ග, විසිතුරු පත්‍ර ඒවායේ වර්ණය, හැඩතල යොදා ගනු ලබන භාජන සහ තබන ස්ථානය පවා එකිනෙකට ගැලපීම අත්‍යාවශ්‍ය වේ. වර්තමානයේ කාර්ය බහුල ජීවන රටාවක වෙහෙසට පත්ව සිටින ඔබට සොබාදහම විඳිමින් රැකියාවක නියැලෙන්නට ලැබේ නම් එය ගතට මෙන්ම සිතට ද විශාල සුවයකි. ආශ්වාදයකි.

එන්න සොබාදහම විඳගන්න. මල් සැකසුම් කලාව වෙත පිවිසෙන්නට ඔබට ආරාධනා. මල් සැකසුම් කලාව සම්බන්ධව ඔබට තොරතුරු අවශ්‍ය නම් 071-223444 දුරකථන අංකයට කතාකරන්න.


**ගොවිකම් සඟරාවට තොරතුරු එක් කළේ,**

**චමරි උදීෂා වික්‍රමපාල**

**දිස්ත්‍රික් විෂයභාර නිළධාරි (වෙනත් බෝග)**
**නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,**
**ලබුදූව - අක්මීමණ**